සුනන්ද දේශප්‍රිය

2015 ජනවාරි විප්ලවය විසින් ඇතිකරන ලද කැපී පෙනෙන ජයග්‍රහණයක් නම් මානව හිමිකම් ගරුකරන රටක් ලෙස ශ්‍රී ලංකාව අන්තර් ජාතික ප්‍රජාව හමුවෙහි ලද පිළිගැනීමයි. ඒ ජය කැපී පෙනෙන හොඳම අන්තර් ජාතික වේදිකාව ජිනීවාහි මානව හිමිකම් කවුන්සිලයයි. මෙම සති අන්තයෙහි අවසන් වූ එහි 32 වන සැසි වාරයේහිදීද ඒ බව මනාව දක්නට ලැබුණි.

මෙම සාධනීය වර්ධනයේ එක් ප්‍රධාන පැතිකඩක් නම් විදේශ අමාත්‍ය මංගල සමරවීර විසින් භාවිතයට නගා ඇති සංහිඳියා රාජ්‍යෝපායයි. ( reconciliation diplomacy) ඒ බව පසුදා අවසන් වූ මානව හිමිකම් කවුන්සිල සැසිවාරයෙහිදී අපූරුවට දක්නට ලැබුණි. රාජපක්ෂ සමයෙහි ශ්‍රී ලංකාව අනුගමනය කළේ දෙන්ඤදම් බැටේ රාජ්‍යෝපායකි. එවැනි රාජ්‍යෝපායක විපාකය වූයේ සතුරන් උග්‍ර සතුරන් බවටද අතරමැදියන් සතුරන් බවට ද මිතුරන් අතරමැදියන් බවට ද පත්වීමය. එය රාජපක්ෂගේ මර්ධනකාරී දේශපාලනයට සම්පාත විය.

අද මෙරට පවත්නා ද්වි පක්ෂ ආණ්ඩුවද එය විසින් මානව හිමිකම් ක්ෂෙත්‍රයෙහි ඇති කරන ලද ප්‍රගතියද විදේශ ඇමැති සමරවීරගේ සංහිඳියා රාජ්‍යෝපාය සමග සම්පාත වෙයි.

මහ කොමසාරිස් සෙයිඩ් විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රගතිය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කළ 29දිනට පෙරදා ජිනීවාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සමාන්තර රැස්වීමක් කැඳවා තිබුණි. එහිදී අදහස් දක්වන ලද්දේ ඇමැති සමරවීර විසිනි.

පැමිණෙන විට සංහිඳියා ක්‍රියාවලියේ වඩා ප්‍රගතියක් සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ පැහැදිලි අදහසක්ද ඇතිව තිබෙනු ඇති බවයි. මෙම සාකච්ඡා සභාව හුදෙක් කරුණු දැනුම්දීමේ එකක් වන ඇතැයි කුකුසක් පැවැතියද එහි වැඩිම කාලය වෙන්වූයේ ප්‍රශ්න සඳහාය. දෙදෙනෙකු හැර අන් සියළුම ප්‍රශ්න අසන ලද්දේ දෙමළ පිරිස් විසිනි. එම ප්‍රශ්ණ බහුතරය පැමිණියේ දෙමළ ඩයස්පෝරාවෙනි. ප්‍රශ්න සමහරක් කටුක සහ උග්‍ර විවේචනයන් විය.
ඇමැති සමරවීරගේ පිළිතුරු ප්‍රවිශ්ඨය වුයේ ප්‍රතිප්‍රහාර දීම වෙනුවට ප්‍රශ්ණයක විවිධ පැති තිබිය හැකි බවත් හොඳම විසඳුම එකට එක්වී ප්‍රශ්ණ මේසය මතට ගෙන විසඳුම් සෙවීම බවත්ය. මේ වනාහී 2007 තරම් කාලයක සිට ශ්‍රී ලංකා-

**<u>රාජපක්ෂ සමයෙහි ශ්‍රී ලංකාව අනුගමනය කළේ දෙන්ඤදම් බැටේ රාජ්‍යෝපායකි.</u>**
**<u>එවැනි රාජ්‍යෝපායක විපාකය වූයේ සතුරන් උග්‍ර සතුරන් බවටද අතරමැදියන් සතුරන් බවට ද මිතුරන් අතරමැදියන් බවට ද පත්වීමය.</u>**

ණ්ඩුව ජිනීවා මානව හිමිකම් කවුන්සිලයෙහිදී දක්වන ලද සතුරු ආකල්පයේ සම්පූර්ණ වෙනසක් විය. එකළ රාජපක්ෂගේ මැති අමැතිවරු මානව හිමිකම් කවුස්සිලයට ආවේ සටන් කරන්නටය. ඒ සඳහා දුසිම් ගණන් පාබල සෙබලුන්ද රැගෙන ආහ.



සම්මුතිබද්ධ ආකල්පයක් බවයි. දෙමළ ඩයස්පෙ-ාරාවෙහි ප්‍රශ්ණයන්ට දක්වන ලද එකඟතා ගොඩ නැගීමේ ප්‍රතිචාර පිළිවෙතද ඒ බව සනාථ කළේය. එපමණක් නොව එම සාකච්ජා සභාව අවසන් වී සෑහෙන වේලාවක් එම පිරිස් සමඟ සුහද අදහස් හුවමාරු කර ගනිමින්ද ශ්‍රී ලංකා දූත කණ්ඩායම රැඳී සිටියේ ය.

2015 සැප්තැම්බර් මාසයේ පැවැති එක්සත්

ගණනාවක්ද සටහන් කරයි.

"අනෙක් කරුණු අරභයාද වඩා ඉක්මන් සහ කල් පවත්නා ප්‍රගතියක් අත්කර ගත හැකිව තිබුණි. එනම් සුලූතර ප්‍රජාවන් තුල විශ්වාසය ගොඩ නැගෙන ඉඩම් සහ රැදවුම්කරුවන් නිදහස් කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත පරිශෙ-ෝධනය කිරීම යනාදියයි. සංකේතබවට පත්ව ඇති සිදුවීම් පරීක්ෂාකිරීමෙහිලා මුලදී ලබා ගත් ප්‍රවේගය දිගටම පවත්වා ගත යුතුය. මන්ද යත් ඉක්මන් නඩු පැවැරීම් සහ විභාගයන් විසින් අතීතයෙහි පැවැති දණ්ඩ මුක්තියෙන් බැහැරවීමේ ලක්ෂයක් බවට පත්විය හැකිව තිබූ බැවිනි. අනීතික අත් අඩංගුවට ගැනීම්. වධහිංසා පැමිණවීම් සහ ලිංගික ප්‍රචණ්ඩත්වයන් මෙන්ම වඩා පුළුල් මිලිටරි සොදිසියන් සහ බිය ගැන්වීම් පිළිබඳ චෝදනා ක්ෂණිකව ආමන්ත්‍රණය කළ යුතුය. එම භාවිතයන් ප්‍රවර්ධනය කළ ව්‍යුහයන් සහ ආයතනික සංස්කෘතිය අහෝසි කිරීම මගින් අතීතයෙහි සිදුවූ භාවිතයන්ට කිසිදු ඉඩක් නො-දෙන බව පෙන්වා සිටිය යුතුය.

# ජිනීවා - සමරවීරගේ සංහිඳියා රාජ්‍යෝපාය

ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 දරණ යෝජනාවෙහිදී දෙන ලද පොරොන්දු අනුව කටයුතු කිරීමට බැදී සිටින බව අවධාරනය කළ ඔහු කියා සිටියේ සංහිඳියා ක්‍රියාවලියෙහි දක්නට ඇති දුබලතා සම්බන්ධයෙන් ආණ්ඩුවද කණස්සල්ලට පත්ව ඇති බවයි. 2017 මාර්තුවෙහිදී තමන් මෙහි



ශ්‍රී ලංකාව පිළිබඳ මහ කොමසාරිස් සෙයිඩ්ගේ වාර්තාවට ප්‍රතිචාර දක්වමින් කොරියානු ජනරජය (දකුණු කොරියාව) කියා සිටියේ ශ්‍රී ලංකාණ්ඩුවේ වත්මන් පිළිවෙත පසුගිය දස වසර තුළ මානව හිමිකම් කවුන්සිලයෙහි දී අත් නොදුටු තරමේ

ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30වන සැසිවාරයේදී සම්මත වූ ශ්‍රී ලංකාවේ වගවීම, සංහිඳියාව සහ මානව හිමිකම් පිළිබඳ 30/1 දරණ යෝජනාව ශ්‍රී ලංකාණ්ඩුව විසින් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිය වාචික වාර්තාව ඉදිරිපත් කළේ 29දාය. 2017 වර්ශයේ මාර්තු මාසයේදී ඔහු විසින් එ අරභයාම විස්තිර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිතය.
සිය වාචික වාර්තාවෙහි නිගමනයන් සෙයිඩ් අල් හුසේන් ආරම්භ කරන ලදදේ පහත සඳහන් වචන වලිනි." 30/1 දරණ යෝජනාවෙහි දී ශ්‍රී ලංකාව විසින් දෙන ලද යම් යම් මූලික පොරොන්දු ඉටු කිරීමට එරට ගෙන ඇති පියවර සමස්තයක් වශයෙන් මානව හිමිකම් කවුන්සිලය දිරිමත් කරවයි.

එකී නිගමනයන් ඔහු විසින් අවසන් කරන ලද්දේ මෙම වචන මගිනි."මෙකී ක්‍රියාවලිය තහවුරු කිරීමට සහ සියළු පරදුකාර පාර්ශයන්ට විශේෂයෙන්ම වින්දිත ප්‍රජාවට සහතිකවීමට සහ විශ්වාසය ඇති කිරීමට මානව හිමිකම් කවුන්සිලයේ දිරිමත්කිරීම සහ සහාය තීරණාත්මක විය. එබැවින් මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාව සම්බන්ධ සිය සමීප ක්‍රියාකාරිත්වය දිගටම පවත්වා ගනු ඇතැයි යන විශ්වාසයෙන් යුතුව 34වන සැසිවාරයේදී වඩා ප්‍රගතියක් වාර්තාකරන්නට මහ කොමසාරිස්වරයා අපේක්ෂා කරයි.

එම වාර්තාවෙහි එන නිගමනයන් විසින් මානව හිමිකම් සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රගතිය පැහැදිළිව අගය කරන අතරම මේතාක් ඉටු නොකර ඇති එනමුත් ඉටු කර හැකිව තිබූ කරුණු

එම වාර්තාවෙන් පසු අදහස් දැක්වූ රටවල් අතුරින් අති බහුතරය ඉදිරිපත් කළ විවේචනාත්මක කරුණු වූයේ ද සෙයිඩ් විසින් පෙන්වවා දෙන ලද එම කාරණාය. සංහිඳියා ක්‍රියාවලිය අරභයා ලංකාණ්ඩුවේ ක්‍රියාකාරිත්වයෙහි විශවසනීයත්වය මැනෙන මිණුම් දඬු බවට බෙහෝ දුරට දැන් පත්ව ඇත්තේ ඉඩම් සහ රැදවුම්කරුවන් නිදහස් කිරීම, ත්‍රස්තවාදය වැළක්වීමේ පනත අහෝසි කිරීම, දණ්ඩ මුක්තිය අහෝසි කිරීම. උතුරු නැගෙනහිර දිගටම පවත්නා යුද කරණය, සහ යුද හමුදා විසින් පවත්වා ගෙන යන හිරිහැරකාරී භාවිතයින්ය.

ශ්‍රී ලංකාණ්ඩුව සම්බන්ධයෙන් ඉහත දැක්වුණු ප්‍රසාදය පළ කළ කොරියානු ජනරජය පවා මෙරට සංහිඳියා පිළිවෙතෙහි මන්දගාමී බව සම්බන්ධයෙන් අදහස් තදින් ඉදිරිපත් කළේය. ඇමැති සමරවීර ද කියා සිටි පරිදි දුෂ්කරම කාර්යය වනු ඇත්තේ අපරාධ විනිශ්චය යාන්ත්‍රණයක් පිහිටුවීමයි. ඒ බව මානව හිමිකම් කවුන්සිලයේ පොදු පිළිගැනීමක්ද වේ. එනමුදු ඊට පෙර ඉක්මණින් විසඳිය හැකි ප්‍රශ්ණ පවා ආ-ණ්ඩුව තවම විසඳා නැත.

සංහිඳියා රාජ්‍යෝපාය හුදෙක් කතා සාප්පුවක් නොවේ. ඒ බව ඇමැති සමරවීරද පිළිගනී. ඔහුම ඉහත කී සාකච්ජා සභාවෙහිදී කියා සිටි පරිදි පුඩිමක රස බැලිය හැක්කේ එය අනුභව කිරීමෙන් පමණි. එනම් අත්දැකිමෙන් තොරව යමක් නිගමනය කළ නොහැකි බවයි. සංහිඳියා රාජ්‍ය-ෝපාය කතාව දෝලාවෙන් ගමන පයින් නොවනු පිණිස ලබන මාර්තු මාසයට පෙර ඉටු කැරෙනු ඇති සංහිඳියා පියවරයන් පිළිබඳ දින වකවානු සහිත මාර්ග සිතියමක් සකස් කිරීම අද අත්‍යවශ්‍ය වේ. මානව හිමිකම් කවුන්සිලයේ 32වන සැසිව-ාරයෙන් ශ්‍රී ලංකාණ්ඩුව උකහා ගත යුතු එක් පා-ඩමක් එයයි.